# බුදු දහම තුළ විවරණය වන සුළු මවගේ භූමිකාවෙහි වර්තමාන සමාජ අවශ්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

*ඒ.කේ.සී. අයේෂානි අබේසිංහ*[1]

සමාජය තුළ කුඩා ම ඒකකය පවුලයි. පවුලේ පියාගේ දෙවන විවාහයෙන් පවුලට එක් වන කාන්තාව සුළු මව හෙවත් පුංචි අම්මා ලෙස ව්‍යවහාර කෙරෙයි. ස්ත්‍රී චරිත අතර වර්තමාන සුළු මවගේ භූමිකාව බෞද්ධ ධර්මානුකූල ද යන ගැටලුව මත ගොඩනැගෙන මෙම පර්යේෂණය සාහිත්‍ය මූලාශ්‍රය අධ්‍යයන ක්‍රමවේදය ඔස්සේ සිදු කෙරේ. ත්‍රිපිටකයේ ථෙරීගාථා පාළිය, අපදාන පාළිය, විනය පිටකය, ජාතකට්ඨකථාව වැනි ප්‍රාථමික මූලාශ්‍රය මෙන් ම ද්විතීක මූලාශ්‍රය ද මෙහි දී පාදක කොට ගනී. බුදුදහම තුළ විවරණය වන සුළු මවගේ භූමිකාව හා වර්තමාන සමාජයේ සුළු මව පිළිබඳ ව ඇති මතය තුලනාත්මක ව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. එමඟින් ආගමානුකූල ව ගොඩනැගුණු සුළු මවගේ භූමිකාවේ වර්තමාන අවශ්‍යතාව සමාජගත කිරීම අපේක්ෂා කරයි. මහාමායා දේවිය කළුරිය කිරීමෙන් පසු එතුමියගෙ නැඟණිය වූ මහා ප්‍රජාපතී ගෝතමී දේවිය සුළු මව වසයෙන් බෝසත් කුමරුට කිරි දී හදාවඩා ගනියි. සුද්ධෝදන රජුට දාව තම කුස උපන් නන්ද කුමරු හා සුන්දරී නන්දා කුමරිය කිරි මව්වරුන්ට භාර දී බෝසත් කුමරු වෙනුවෙන් ම වෙහෙසුණ ඇය සුළු මවුවරුන් අතර උත්තරීතරත්වයට පත් ආදර්ශවත් කාන්තා චරිතයකි. බෝසතාණන් වහන්සේ බුදු බව ලැබීමෙන් අනතුරු ව ප්‍රජාපතිය ඇතුළු පන්සියයක් කාන්තාවන්ට පැවිදි භූමියට ඇතුළත් වීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනුයේ කාන්තාවකට ලැබිය හැකි භාග්‍යවන්ත ම අවස්ථාව උදා කර දෙමිනි. ප්‍රජාපතී ගෝතමී රහත් මෙහෙණින් වහන්සේ මවු කිරි පෙවූ බුදු මවු බවත් දහම් කිරි පෙවූ බුදුහිමියන් එතුමියගේ පියාණන් ලෙසත් දක්වාලන අතර සුළු මවක් වසයෙන් එතුමියගේ චරිතාපදානය විමසීම වර්තමානයට ඉතාමත් කාලෝචිත ය. විවාහය, දික්කසාදය සුළු කොට තකා දරුවන් අසරණ කරන සමාජයක පුංචි අම්මා කෙනෙකුට සැබෑ මවක් ව දාරක ස්නේහයෙන් යුක්ත ව කටයුතු කිරීමට එමඟින් මාර්ගෝපදේශය සැලසේ. තම කුස නොදැරුවත් තම දරුවන් හා සමාන ව ම මෙත්තා කරුණා ආදි සතර බ්‍රහ්ම විහරණයන්ගෙන් යුක්ත ව කටයුතු කිරීමට හැකි වීම සුළු මවක් වසයෙන් ඇගේ භූමිකාව මවක් දක්වා පරිවර්තනය වීමක් ලෙස පෙන්වාදිය හැකි ය. වර්තමාන සමාජය තුළ සුලභ වන සුළු මවගේ භූමිකාව, බුදු දහම තුළ විවරණය කරනා අයුරින් හැඩගස්වා ගැනීමෙන් සමාජ විෂමතාව හා ප්‍රචණ්ඩත්වය අවම වීමට හේතු සැලසේ. මෙලෙස බුදු දහම තුළ විවරණය කරනා සුළු මවකගේ භූමිකාවේ වූ සාරය සමාජගත කරලීම තුළින් දාරක ස්නේහයෙන් පිරී දයානුකම්පාවෙන් පෝෂිත ධර්මානුකූල සමාජ වටපිටාවක් ගොඩනඟා ගැනීමට අවකාශය සැලසෙන බව නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** දාරක ස්නේහය, ප්‍රජාපතී ගෝතමී දේවිය, බුදු දහම, සුළු මව, සමාජය

[1] නාගානන්ද ජාත්‍යන්තර බෞද්ධ අධ්‍යයන ආයතනය, කැලණිය. chamoayesha9653@gmail.com